# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**
**2017 අප්‍රේල් - ජූනි**
**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH – E 2025**

**සංස්කෘතික ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය**

**I කොටසින් එක් ප්‍රශ්නයක් ද II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද අතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## I – කොටස

01. දෙස් විදෙස් විද්වතුන්ගේ අර්ථ නිරූපණ කෙරෙහි අවධානය යොමු කරමින් සංස්කෘතිය හා එහි ව්‍යුහය පිළිබඳ පැහැදිලි කරන්න.

02. සිංහල සමාජ සංවිධානය හා කුල ක්‍රමය අතර පැවැතියේ කෙබඳු සබඳතාවක් දැ'යි නිදසුන් සහිතව පහදන්න.

03. ජනප්‍රිය සංස්කෘතිය මගින් සාම්ප්‍රදායික සිංහල සංස්කෘතිය කෙරෙහි ඇතිවන බලපෑම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

## II – කොටස

04. ජනශ්‍රැතිය යනු කුමක් දැ'යි පැහැදිලි කොට ඊට අයත් ප්‍රමුඛාංගයක් වන ජන කවිය මගින් සාම්ප්‍රදායික සිංහල ජනජීවිතය පිළිබඳ හැදෑරීමට සැපයෙන පිටුබලය කෙබඳුදැ'යි සාකච්ඡා කරන්න.

05. කිසියම් රටක ඓතිහාසික තොරතුරු පිළිබඳ අධ්‍යයනය කිරීමේ මූලාශ්‍රයක් වශයෙන් පුරාවෘත්තවල පවතින වැදගත්කම විභාග කරන්න.

06. "භාරතීය චරිතයක් තේමා කර ගැනුණු කෘතියක් වුවද යසෝදරාවතට මහනුවර කාලීන සමාජ පසුබිම ප්‍රවේශ වී ඇත." මේ කියමනෙහි සත්‍යාසත්‍යතාව පහදන්න.

## III – කොටස

07. විවිධ භාෂා පවුල් පිළිබඳ හැඳින්වීමක් කොට සිංහලය ඉන් කිනම් භාෂා පවුලකට අයත් වේ දැ'යි නිදසුන් සහිත ව පහදන්න.

නැතහොත්

සිංහලය අනාර්‍ය්‍ය මූල භාෂාවකැ'යි ඇතැම් විද්වතුන් පළ කළ මතවලට පදනම් වූ කරුණු පිළිබඳ විමසීමක් කරන්න.

08. සිදත් සඟරා අක්ෂර මාලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට එය නූතන සිංහල ලේඛන ව්‍යවහාරයට අදාළ අක්ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පහදන්න.

09. ආයාසී සන්ධි හා නිරායාසී සන්ධි යනු කුමක්දැ'යි විස්තර කොට සිදත් සඟරාවේ අන්තර්ගත **ස්වර සන්ධිය, ස්වරාදේශ සන්ධිය, ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය හා ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය** පිළිබඳ විවේචනාත්මක විස්තරයක් කරන්න.

10. සිංහලයේ ලිංග වර්ගීකරණය පාලි - සංස්කෘත ලිංග වර්ගී කරණයෙන් වෙනස් වන ආකාරය පහදන්න.

නැතහොත්

කාරක විභක්ති, අකාරක විභක්ති, ප්‍රධාන කාරක, අප්‍රධාන කාරක වෙන් වශයෙන් හඳුන්වා ක්‍රියාව හා කාරක අතර පවත්නා සම්බන්ධය පහදන්න.

( ප්‍රශ්නයකට ලකුණු 20 බැගින්)

**********************